Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

## පුනරීක්ෂණ අභ්‍යාස

නිපුණතාවය :- 4.0 මැටි හඳුනා ගනිමින් නිර්මාණකරණයෙහි යෙදෙයි.

නිපුණතා මට්ටම :- **4.4 මැටි භාණ්ඩ අලංකරණය**

- දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01)මැටි භාණ්ඩ අලංකාර කිරීම සඳහා විවිධ අවස්ථා යොදාගැනේ.කැටයම් කැපීම හා ඔංගෝබ් යෙදීම යන අලංකරණ ක්‍රම යෙදීමට සුදුසු අවස්ථාව වන්නේ,

1.නිෂ්පාදන අවස්ථාවය. 2.පිළිස්සීමෙන් පසු අවස්ථාවය.

3.හොඳින් වියළි අවස්ථාවය. 4.හම්පදම් අවස්ථාවය.

(02)මැටි භාණ්ඩ අලංකරණයේදී සායම් ආලේපය මෙන්ම විවිධ පාරිසරික ද්‍රව්‍ය භාවිතා කර රටා ලබා ගැනීමද සිදුකෙරේ.මෙහි දැක්වෙන මැටි බඳුන අලංකාර කර ඇත්තේ,



1.ඉරටුවක ආධාරයෙන් රටා ගොඩනඟා ගැනීමෙනි.

2.ස්පොන්ච් කැබලි ආධාර කරගැනීමෙනි.

3.මාබල් ක්‍රමයට ක්‍රමවත්ව යොදාගැනීමෙනි.

4.සායම් වත්කර කැරකැවීම මඟිනි.

(03)මැටි භාණ්ඩ අලංකාර කිරීම සඳහා පහත සඳහන් ක්‍රම ශිල්ප භාවිතයට ගැනේ.

A – කැටයම් කැපීම.

B – මාබල් රටා යෙදීම.

C – දිස්න දැමීම.

D – ඩෙකොපාජ් රටා යෙදීම.

ඉහත සඳහන් ඒවායින් නිදුලතටු තත්වයට පුළුස්සන ලද මැටි බඳුනක් අලංකාර කිරීමට යෙදිය හැකි අලංකරණ ක්‍රම වන්නේ,

1.A , B සහ C ය. 2. A, C සහ D ය.

3.B , C සහ D ය. 4. A , B සහ D ය.

(04)මැටි භාණ්ඩ අලංකාර කරගැනීම සඳහා භාවිත කරන ඉහළම වටිනාකමක් ඇති අලංකරණය ලෙස සැලකෙන්නේ දිස්න දැමීම හෙවත් ඔප මිශ්‍රණ ගැල්වීමයි.ඒ සඳහා සුදුසු භාණ්ඩ වන්නේ,

1.අච්චු මාර්ගයෙන් සාදාගත් මැටි බඳුන්ය.

2.හම්පදමට වියළාගන්නා ලද මැටි බඳුන්ය.

3.නිදුලතටුතාවයට පුලුස්සාගත් මැටි බඳුන්ය.

4.අව්වේ වියළාගන්නා ලද මැටි බඳුන්ය.

(05)නිෂ්පාදකයෙකු අලෙවිකරණය සඳහා භාණ්ඩයක් නිපදවීමේ දී වඩාත් සැළකිලිමත් විය යුත්තේ,

1.භාණ්ඩයේ හැඩය පිළිබඳවය.

2.වෙළඳපොළ ඉල්ලුම පිළිබඳවය.

3.නිෂ්පාදන වියදම පිළිබඳවය.

4.භාණ්ඩයට යෙදිය යුතු වර්ණ පිළිබඳවය.